කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

**සමාජීය විද්‍යා පීඨය**

සංවර්ධන අධ්‍යයනය - DVST - E1025

ග්‍රාමීය සහ ප්‍රාදේශීය සංවර්ධනය

පුශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි කාලය : පැය 03 යි

01. කිසියම් රටක ජාතික සංවර්ධනය ක්‍රියාවලිය කෙරෙහි ප්‍රාදේශීය සංවර්ධන විෂමතා පැවතීම අහිතකර ලෙස බලපාන අයුරු පැහැදිලි කරන්න.

02. දකුණු ආසියානු රටවල ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි කෘෂිකාර්මික අංශය මත බලාපොරොත්තු තැබීමට තිබෙන අවකාශය පරීක්ෂා කරන්න.

03. ශ්‍රී ලංකාවේ කුඩා ඉඩම් හිමි ගොවීන් සඳහා විශේෂයෙන් ක්‍රියාත්මක කරන ලද සහනාධාර සහ කෘෂි ණය වැඩසටහන්වල ඵලදායිත්වය අගය කරන්න.

04. ශ්‍රී ලංකාවේ වඩාත් පසුගාමී පළාතක් හඳුන්වා එහි සංවර්ධන ගැටළු සහ ඒවාට විසඳුම් ලෙස රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

05. දියුණු වෙමින් පවත්නා බොහෝ රටවල ග්‍රාමීය හා නාගරික වශයෙන් පවත්නා සංවර්ධන පරතරය කෙරෙහි හේතු වී ඇති සාධක සාකච්ඡා කරන්න.

06. ප්‍රාදේශීය සංවර්ධනයෙහි ලා, පළාත් පාලන ආයතනයන් හි කාර්යභාරය පිළිබඳව, ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇසුරින් විමසන්න.

07. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම සඳහා රජය ගෙන ඇති වැඩ පිළිවෙළ මගින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ලැබෙන පිටිවහල අගය කරන්න.

08. ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු **දෙකක්** පිළිබඳව කෙටි සටහන් සපයන්න.
   - අ. කාර්යමය ප්‍රදේශ (Functional Regions)
   - ආ. ප්‍රසාරණ බලපෑම් (Spread Effects)
   - ඇ. ප්‍රජා මූලික සංවිධාන
   - ඈ. දේශගුණික වෙනස්වීම්
   - ඉ. ග්‍රාමීය කර්මාන්ත

******************************